# අන්තරාභව සංකල්පය පිළිබඳ ථෙරවාදී ඉගැන්වීමෙහි ව්‍යාකූලත්වය

අක්මීමන ධම්මපාල හිමි

මරණින් පසු සත්ත්වයාට කුමක් සිදුවේ ද යන ප්‍රශ්නය මානව ඉතිහාසයේ ආරම්භයේ සිට ම පවතින්නකි. විවිධ ආගමික සම්ප්‍රදායයන් විසින් මේ පිළිබඳව එකිනෙක හා නොගැලපෙන නොයෙක් මතවාද ඉදිරිපත් කර ඇත. මරණින් පසු සියල්ල අවසන් වේ යන මතවාදය ඇතැම් සම්ප්‍රදායයන් විසින් ඉදිරිපත් කර තිබේ. මෙය උච්ඡේද දෘෂ්ටිය වශයෙන් හැඳින්වේ.[1] දාර්ශනිකයන් මෙම ප්‍රශ්නයට ඉදිරිපත් කර ඇති විසඳුම් විවිධාකාරය.

ප්‍රකට ආගමික සම්ප්‍රදායයන් කිහිපයක් මේ පිළිබඳව ඉදිරිපත් කළ මතවාද පිළිබඳව අපේ අවධානය යොමු කිරීම සුදුසුය. කතෝලික මුස්ලිම් හින්දු ආදී ආගමික සම්ප්‍රදායයන් පිළිබඳ සැලකූ විට කතෝලික බැතිමතුන් සදාකාලික ස්වර්ගය සදාකාලික අපාය සදාකාලික දෙවිමව් තුරුලේ නිත්‍ය සැතපීම යන විවිධ වචනවලින් හඳුන්වන එක්තරා ශාස්වතවාදී අදහසක් පිළිගන්නා බව පෙනේ. මුස්ලිම් බැතිමත්හු ද මරණින් මතු සර්වබලධාරී සදාකාලික අල්ලාහ් දෙවියන් වහන්සේ සමඟ එක්වීමට අපේක්ෂා කරති. හින්දු ද විශ්ව නිර්මාපක වූ බ්‍රහ්මන් සමඟ එකතුවීමෙන් බ්‍රහ්ම සහව්‍යතාවට පත්වීමට බලාපොරොත්තු වෙති. මේ විශ්ව නිර්මාපක සර්වබලධාරී දෙවියන් බ්‍රහ්ම, විශ්ණු, ප්‍රජාපති ආදී විවිධ නම්වලින් උපනිෂද් ග්‍රන්ථවල ද හඳුන්වා ඇති බව පෙනේ. මෙසේ නොවෙනස් වූ ආත්මයක් තම තමන් බලාපොරොත්තු වන මෝක්ෂය වෙත ගමන් කළ යුතු බව මෙම ආගමික සම්ප්‍රදායයන් විසින් පොදුවේ පිළිගෙන ඇති මතය බව පෙනෙයි.

තණ්හා ආදී දුක් කෙළවර නොකළ සත්ත්වයා පුන පුනා සසර උපදින බව බුදුසමයේ ඉගැන්වීමයි.[2] මෙහි දී බොහෝ ආගමික සම්ප්‍රදායයන්හි පිළිගැනීමට ලක්වූ වෙනස් නොවන ආත්මයක් හෝ අනන්‍ය වූ විඤ්ඤාණයක පැවැත්ම බුදුරදහු බැහැර කළහ. එහෙත් බුද්ධ කාලයේ විසූ ඇතැම් ශාක්‍ය පුත්‍රීය භික්ෂූන් පවා උක්ත මතය දැරූ

බව පෙනෙයි.[3] මෙම අනන්‍ය වූ විඤ්ඤාණය පිළිබඳ මතය දැඩිසේ ප්‍රතික්ෂේප කළ භාග්‍යවතුන් වහන්සේ උක්ත මතය දැරූ සාති භික්ෂුව මෝඝවාදයෙන් අමතා[4] පටිච්චසමුප්පන්න වූ විඤ්ඤාණ ධාරාවක සංසරණය ම පැනවූහ.[5] එසේ ම ප්‍රත්‍ය ධර්මයන්ගෙන් තොරව මේ විඤ්ඤාණයේ සම්භවයක් ද නැති බව වදාළහ.[6] සෙසු ප්‍රත්‍ය ධර්මයන් ද සම්පූර්ණ වූ විට විඤ්ඤාණය ප්‍රතිසන්ධි ග්‍රහනය සඳහා යොමුවේ. සත්ත්වයා ආයති භවය කරා යොමුකිරීමට හේතුවන ප්‍රධාන සාධකය වශයෙන් කර්මය ද මෙහි දී ක්‍රියාත්මක වේ.[7]

පුද්ගලයා විසින් සිදුකරන පුණ්‍ය හා පාප කර්මයන්ගේ විපාක අනුව පුනර්භවය හෙවත් ඊළඟ භවය කරා ගමන් කිරීම සිදුවන බව මෙයින් කියවේ. මෙසේ මෙම ජීවිතය හා ඊළඟ භවය අතර සම්බන්ධය ඇති කරන පුරුක හේතුව හෙවත් කාරකය වන්නේ පටිච්චසමුප්පන්න වූ විඤ්ඤාණයයි. එම පටිච්චසමුප්පන්න වූ විඤ්ඤාණය ද ප්‍රත්‍ය සම්බන්ධයෙන් තොරව නො පවතී. මෙම පටිච්චසමුප්පන්න වූ විඤ්ඤාණ ධාරාව හා ඊට සම්බන්ධ ප්‍රත්‍යයන් පිළිබඳව සංයුත්ත නිකායේ බීජ සූත්‍රයේ කරුණු දක්වා ඇත. එහි දී බුදුරදුන්, ''රූප වේදනා සඤ්ඤා සංඛාරයන්ගෙන් තොරව විඤ්ඤාණයේ ඒමක් හෝ යෑමක් හෝ චුතවීමක් හෝ උත්පත්තියක් හෝ වැඩීමක් හෝ නැගීමක් හෝ පැතිරීමක් හෝ සිදු නොවේ.[8] යනුවෙන් වදාරා ඇත.

පටිච්චසමුප්පාදය ඉතා පැහැදිලිව ආනන්ද හිමියන්ට පැහැදිලි කරදුන් මහා නිදාන සූත්‍රයේ ආයති භවයේ ප්‍රතිසන්ධිග්‍රහණය මෙසේ පිළිබඳ කරුණු ඉදිරිපත් කර ඇත.

I. ''ආනන්දය, විඤ්ඤාණය මවු කුසට නොබැස ගන්නේ නම් මවුකුසේ නාම රූප (කලලය) පහළ වන්නේ ද?'' ''නැත ස්වාමිනී''

II. ''ආනන්දය, විඤ්ඤාණය මවු කුසට බැස ඉන් ඉවත්ව යන්නේ නම් නාම රූප දෙක ඒ ලෝකය සඳහා පහළ වන්නේ ද?'' ''නැත ස්වාමිනී''

III. ''ආනන්දය, ළදරු කුමරෙකුගේ හෝ කුමරියකගේ විඤ්ඤාණය (මවු කුසේ අතර මගදී) සිඳී යන්නේ නම්, කැඩී යන්නේ නම් ඒ නාම රූපයන් තවදුරටත් වැඩී යාම, නැගී යාම, විපුල බවට පත්වීම සිදුවන්නේ ද?'' ''නැත ස්වාමිනී''



IV. ''ආනන්දය, විඤ්ඤාණය නාම රූපයන්ගේ පිහිට නොලබන්නේ නම් මතු ජාති ජරා මරණ දුක් හටගන්නේ ද?'' ''නැත ස්වාමිනී''

V. ''ආනන්දය, මේ අනුව නාම රූප ප්‍රත්‍ය කොට ගෙන විඤ්ඤාණය පවතින බව දතයුතුය.[9]

මෙහි විස්තර කරන ආකාරයට දාරක ප්‍රතිසන්ධිග්‍රහණය සඳහා අනෙකුත් අවශ්‍ය භෞතික සාධක සම්පූර්ණ වුවත් විඤ්ඤාණයේ එළඹීම අත්‍යවශ්‍ය කරුණකි. අනිවාර්ය සාධකයකි. අනෙකුත් අවශ්‍ය භෞතික සාධක සම්පූර්ණ වූ අවස්ථාවක දී විඤ්ඤාණය මව් කුසට ඇතුල් වී සිට (බැසගෙන සිට) කිසියම් හේතුවක් නිසා ඉවත් වී ගිය හොත් එම මවුකුසේ නාම රූප ධර්ම තවදුරටත් සංවර්ධනය නොවන බව දක්වා තිබීමෙන් මේ සඳහා විඤ්ඤාණයේ උපයෝගී බව වඩාත් අවධාරණය කර ඇත. මවුකුසක ප්‍රතිසන්ධිග්‍රහණය සිදු වී මාස කීපයක් ගතවීමෙන් පසුව හෝ කර්ම ශක්තියේ මෙහෙයවීම මත හෝ විඤ්ඤාණය එම මවුකුස අතහැර ගියහොත් තවදුරටත් එම නාම රූප සන්තතිය වර්ධනයවීම සිදු නොවන බව ද එහි දී පැහැදිලිව අවධානයට යොමු කර ඇත. මෙවැනි අවස්ථාවල දී දරු කලල හෝ නොමේරූ දරුවන් ප්‍රසූත වන බව ප්‍රකට කරුණකි. මෙවැනි කලල හෝ නොමේරූ දරුවන්ට තවදුරටත් ජීවත් වීමට නොහැකිය. එය ජීවශක්තියෙන් තොරය.

ප්‍රතිසන්ධිග්‍රහණයේ දී මෙන් ම මවුකුසෙහි දරු ගැබක් වර්ධනය වීමේ දී ප්‍රධාන පාර්ශ්වයක් හැටියට විඤ්ඤාණය ක්‍රියා කරන බව මෙයින් පැහැදිලි වේ. ඒ අනුව මෙම ජීවිතය හා ආයති භවය අතර සම්බන්ධීකරණය සිදු කරන රැහැන වශයෙන් සැලකිය හැක්කේ පටිච්චසමුප්පන්න විඤ්ඤාණ ධාරාව බව පෙනී යයි.

සම්මුති මරණයෙන් පසු ශරීරය අතහැර යන විඤ්ඤාණයේ ස්වභාවය හා පැවැත්ම පිළිබඳව ඉතා වැදගත් දාර්ශනික සාකච්ඡාවක් බුදුරදුන් හා වච්ඡගොත්ත බ්‍රාහ්මණ පඬිතුමා අතර සිදු වූ අවස්ථාවක් සංයුත්තනිකායේ දක්නට ලැබේ. එහි දී වච්ඡගොත්ත බුදුරදුන්ගෙන් ප්‍රශ්න කරන්නේ, ''භවත් ගෞතමය, ගින්නක් දැල් වූ කල්හි ගිනිදැල් ඉහළට යන බව පෙනෙයි. මෙම ගිනිදැල්වලට ඉහළට යාමට ආධාර

වන්නේ කුමක් ද?" යනුවෙනි. "ගිනිදැල්වලට ඉහළට යාමට වාතය ආධාර වේ. උපාදාන වේ." මෙහි දී බුදුරදහු පිළිතුරු දුන්හ.

වාතය නැති තැනක දී රික්තයක දී ගිනි දැල්විය නොහැකි බව ප්‍රකට කාරණයකි. මේ අනුව ගින්නෙහි පැවැත්මට වාතය අත්‍යාවශ්‍ය කාරණයකි. වච්ඡගොත්තගේ මීළඟ ප්‍රශ්නය වන්නේ, "භවත් ගෞතමය, සත්ත්වයා යම් අවස්ථාවක දී මේ ශරීරය අත්හරී ද වෙනත් වෙනත් ශරීරයකට ඇතුල් නොවූයේ වේද? මේ අතර කාලයේ රැදී සිටින්නේ කෙසේ ද? ඒ සඳහා කුමක් උපාදාන වේ ද ආධාර වේ ද?" යන්නයි. මෙහිදී බුදුරදුන් පිළිතුරු දෙමින්, "වච්ඡය, සත්ත්වයා යම් අවස්ථාවක දී මේ කය අත්හරී ද (තවම) වෙනත් කයකට නොපැමිණියේ වේද, එතැන දී මම තණ්හාව උපාදාන කොට පවතී යයි කියමි.[10] යි වදාළහ.

මෙහි දී සත්ත්වයා මේ කය අත්හරී, නැත්නම් මරණයට පත්වෙයි. වෙනත් කයකට නොපැමිණියේ ද වේ. යනුවෙන් අතරත හිඩැසක් නොපතී යයි බුදුරදහු නොවදාළහ.

මීට අනුව සම්මුති මරණයේ දී සත්ත්වයා මේ කය අත්හරී. වෙනත් කයකට හෙවත් මවු කුසක ප්‍රතිසන්ධිග්‍රහණයට හෝ දිව්‍ය ප්‍රේතාදී භවයකට හෝ ඇතුළත් නොවූයේ වෙයි. මේ දෙක අතරත කිසියම් ඉඩක් ඇති බව ඉහත දේශනා පාඨවලට අනුව පෙනී යයි. මෙයින් තේරුම්ගත හැක්කේ තණ්හාවෙන් යුත් පුද්ගලයා උපාදාන ශක්තිය මත රැදී සිටින බව නොවේ ද? පටිච්චසමුප්පාදයෙහි "තණ්හා පච්චයා උපාදානං" "උපාදාන පච්චයා භවො" යනුවෙන් අර්ථ දක්වන්නේ මෙය නොවේ ද? එසේ නම් ඒ භවය අන්තරාභවයක් විය නොහැකි ද? යනුවෙන් මෙහි දී විමසිය යුතු ය.

භව දෙකක් අතරත ඇති අවකාශය ථෙරීය ගුරුකුලය විසින් මේ ආකාරයට පිළිගෙන නැති බව පෙනේ. ඉහත දැක්වූ සංයුත්තනිකායේ කුතුහලසාලා සූත්‍ර අටුවාවට අර්ථ දක්වන සාරත්ථප්පකාසිනීය ද පවසන්නේ විමසුම් නුවණින් භාර ගත නොහැකි ව්‍යාකුල මතයකි. "මේ ශරීරයෙන් නික්මීම නම් චුති චිත්තයෙන් නික්මීමයි. නොඑළඹීම නම් චුති ක්ෂණයෙහි දී ම ප්‍රතිසන්ධි සිතේ නොපැමිණීමයි.[11] යනුවෙනි. විසුද්ධිමාර්ගය ද කම්මභව උත්පත්ති භව වශයෙන් මෙහි දී ඉදිරිපත් කරන විස්තරය එතරම් පැහැදිලි නැත.[12]



කථාවත්ථුප්පකරණයේ අට වැනි වර්ගයේ දෙවන කථාවත්ථුව වශයෙන් විවිධ ප්‍රශ්න මතුකරමින් අන්තරාභවයක් හෙවත් ජීවිත දෙකක් අතරත කිසියම් ඉඩක් අවකාශයක් ඇත යන මතය ප්‍රතික්ෂේප කර ඇත.[13] එහි දී පරවාදියෙක් ඉදිරියේ නැතිව සකවාදියා විසින් ම ප්‍රශ්න නගා ඒවාට පිළිතුරු දෙමින් එම ග්‍රන්ථයෙහි දක්වා ඇති නිගමන බොහෝ සෙයින් ඒකපාක්ෂිකය. පඤ්චප්පකරණ අට්ඨකථාව ද මේ භව දෙකක් අතර ඇති අවකාශය පුබ්බසේලීය සම්මිතීය නිකායිකයන් දැරූ මතයකැයි පවසමින් ඔවුන්ගේ වාදයේ සංක්ෂේප විස්තර ද දක්වමින් එය නොපිළිගත හැකි බව ප්‍රකාශ කරයි. අභිධර්මාර්ථ සංග්‍රහයට රචනා කළ අභිධම්මත්ථවිභාවිනී ටීකාවේ පස්වැනි පරිච්ඡේදයේ දී "අන්තරාභවවාදී මතං ආචරියො පටික්ඛිපති"[14] යනුවෙන් සෘජුව ම අන්තරාභවය ප්‍රතික්ෂේප කරයි. දෙවන සංගායනාවෙන් පසු ක්‍රමයෙන් ප්‍රබල තත්ත්වයට පත්වූ සම්මිතීය හා වජ්ජිපුත්තක ආදී පුද්ගලවාදීන්ට පිළිතුරුදීම සඳහා බුදුසමයේ දැක්වෙන මූලික සිද්ධාන්තයක් වූ සංශ්ලේෂණ හා විශ්ලේෂණ න්‍යාය කේන්ද්‍ර කොටගෙන තෙවන සංගායනාව දක්වා සප්තප්‍රකරණයක් හැටියට අභිධර්ම සාහිත්‍ය වර්ධනය වූ බව විද්වතුන්ගේ පිළිගැනීමයි. අභිධර්ම විශේෂඥවරියක් වූ රීස් ඩේවිඩ්ස් මහත්මිය අභිධර්මය පිළිබඳ ස්වකීය අදහස මෙසේ දක්වා ඇත.

"අභිධර්මය විස්තර විභාග හා අර්ථව්‍යාඛ්‍යාන සහිත සූත්‍රාන්ත ධර්මයන් ම නැවත වරක් විස්තර කරන්නකි. එම නිසා පැරණි බුදුසසමයට අයත් දර්ශනයට අලුතින් එක්කාසු කරන ලද කිසිවක් එහි නැත. එහි ඇත්තේ සූත්‍රාන්තයන් හි දක්වා ඇති කරුණු විභාග කොට තර්කානුකූලවත් ක්‍රමානුකූලවත් විස්තර කිරීමකි. එම නිසා සූත්‍රවල අන්තර්ගත කරුණු එක්තරා ක්‍රමයකට පිළියෙල කිරීමත් වචනවල ලක්ෂණ හා අර්ථ එක්තරා ක්‍රමයකට විග්‍රහ කිරීමත් අභිධර්මයේ කාර්යය යි"[15] "අභිධර්මයේ සම්භවය හා වර්ධනය ඓතිහාසිකව සිදුවූවකි"[16] වඩාත් පශ්චාත් කාලීන හැටියට වියතුන් පිළිගන්නා අභිධර්ම සාහිත්‍යයේ මෙසේ සඳහන් වූවත් වඩාත් පැරණි වශයෙන් වියතුන්ගේ පිළිගැනීමට ලක් වූ මූලික සූත්‍ර දේශනාවල මෙම අන්තරාභවය පිළිබඳ හා ඊට ආනුෂංගික වශයෙන් විස්තර සඳහන් බොහෝ තොරතුරු දක්නට ලැබේ.

මේ භවය හා ආයති භවය අතර සම්බන්ධය ඇති කරන රූප, වේදනා, සඤ්ඤා, සංඛාරයන්ගෙන් සැදුම්ලත් පටිච්චසමුප්පන්න විඤ්ඤාණය මරණයේ දී සිරුර අතහැර වෙනත් භවයක් කරා ගමන් කරන බව අප ඉහතින් සඳහන් කළ සංයුත්ත නිකායේ බීජ සූත්‍රයට[17] අනුව පැහැදිලි වෙයි. එවිට එහි සියුම් වූ ස්කන්ධ පඤ්චකයකින් සැදුම්ලත් තත්ත්වයක් දැකිය හැකිය. ඒ සියුම් ස්කන්ධ පඤ්චකය පිළිබඳ පොට්ඨපාද සූත්‍රයේ මෙසේ සඳහන් වෙයි. පොට්ඨපාද අසන ප්‍රශ්නයකට පිළිතුරු දෙන බුදුරන් ප්‍රකාශ කරන්නේ,

I. ''සත්ත්වයා ආත්මප්‍රතිලාභ තුනකින් යුක්තය'' ''රූපවත් වූ සතර මහා භූතයන්ගෙන් සැදුම්ලත් කබලීකාරාහාර අනුභව කරන ඕලාරික වූ අත්තපටිලාභය''

II. ''රූපවත් වූ මනෝමය වූ සියලු අඟපසඟින් යුත් නොපිරිහුණ ඉඳුරන් ඇති මනෝමය අත්තපටිලාභය''

III. ''රූපවත් නො වූ සඤ්ඤාමය වූ අරූපී අත්තපටිලාභය''[18]

මෙහි දෙවනුව දක්වන මනොමය අත්තපටිලාභය ගැල සලකා බැලීමේ දී පෙනීයන්නේ එය එකදු ඉන්ද්‍රියයක් හෝ අඩු නො වූ සියලු අංග ප්‍රත්‍යංගයන්ගෙන් යුක්ත වූ එහෙත් මනෝමය වූ තත්ත්වයක් බවය. මේ අනුව එය සියලු අඟපසඟින් යුක්ත වූ මනෝමය ශරීරයක් බව පෙනීයයි. එසේ ම මේ මනෝමය ශරීරය අප සියලු දෙනාම තුළ පවතී. වර්තමාන සමාජයේ මෙය සූක්ෂ්ම ශරීරය හෙවත් Astral Body යන ජනප්‍රිය නාමයෙන් හඳුන්වනු ලැබේ. මහාසකුළුදායි සූත්‍රයේ විස්තර කරන පරිදි,

I. ''තථාගතයන් වහන්සේ දේශනා කරන ලද ප්‍රතිපදාවේ ඒ වූ පරිද්දෙන් කටයුතු කරන ශ්‍රාවකයෝ මේ කයින් අනිත් කයක් නිර්මාණය කරති. එය කෙබඳු වූ කයක් ද? රූපවත් වූ මනෝමය වූ සියලු අඟපසඟ ඇති ඉන්ද්‍රියන්ගෙන් හීන නොවූ කයකි''

II. ''උදායි, යම් සේ පුරුෂයෙක් මෘදු තණ ගසකින් ගොබය ගලවන්නේ ද ඔහුට මෙබඳු සිතක් වේ. මෙය මෘදු තණ ගසකි. මෙය ගොබය වේ. මෘදු තණ ගස අනිකකි ගොබය අනිකකි. මෘදු තණ ගසින් ම ගොබය ගලවන ලද්දේය.



III. ''උදායි, යම් සේ පුරුෂයෙක් සර්පයා පෙට්ටියෙන් ඉවත් කරන්නේ ද, ඔහුට මෙබඳු සිතක් වේ. මේ සර්පයාය. මේ පෙට්ටියය. සර්පයා අනිකකි. පෙට්ටිය අනිකකි. පෙට්ටියෙන් ම සර්පයා ඉවත් කරන ලද්දේය කියාය.

IV. ''උදායි, යම් සේ පුරුෂයෙක් කඩුව කොපුවෙන් ගලවයි ද ඔහුට මෙබඳු සිතක් වේ. මෙය කඩුවය. මෙය කොපුවය. කඩුව අනෙකකි. කොපුව අනෙකකි. කොපුවෙන් ම කඩුව ගලවන ලද්දේය කියාය.

V. ''එසේ ම උදායි, මා විසින් දේශනා කරන ලද ප්‍රතිපදාවේ ඒ වූ පරිද්දෙන් ම කටයුතු කරන ශ්‍රාවකයෝ මේ කයින් රූපවත් වූ මනෝමය වූ සියලු අඟපසඟ ඇති ඉන්ද්‍රියයන්ගෙන් හීන නොවූ වෙනත් කයක් නිර්මාණය කරති''[19]

මෙම ප්‍රකාශනයන්ට අනුව බුද්ධ වචනයෙහි මනාලෙස හික්මෙන භික්ෂුවට භෞතික කයින් මනෝමය කය රිසි සේ ඉවතට ගත හැකි බව පැහැදිලි වෙයි. මෙසේ මනෝමය ශරීර නිර්මාණය කිරීමට සමත් භික්ෂූන් අතර චුල්ලපන්ථක හිමියෝ අග්‍රස්ථානය ලැබූහ.[20] ඒ අනුව මෙහි වශීභාවයට පත්වීමෙන් බොහෝ මනෝමය සිරුරු නිර්මාණය කිරීම දක්වා මේ ශක්තිය දියුණු කළ හැකි බව පෙනේ. මෙසේ සිත දියුණු කළ උතුමන්ට ඕලාරික සිරුරෙන් මනෝමය ශරීර කැමති පරිද්දෙන් ඉවතට ගත හැකි වෙයි. සාමාන්‍ය පුහුදුන් පුද්ගලයා පවා මරණයට පත්වීමේ දී මෙම පටිච්චසමුප්පන්න විඤ්ඤාණය සහිත මනෝමය ශරීරය ඕලාරික ශරීරයෙන් ඉවත් වී යන බව මේ අනුව පැහැදිලි වෙයි.

මෙසේ ඉවත් වී යන මනෝමය ශරීරය ''ගන්ධබ්බ'' යන වචනයෙන් ඇතැම් සූත්‍ර දේශනාවල දක්වා ඇත. අන්තරාභවික තත්ත්වයට පත්වන්නේ මේ මනෝමය ශරීරය විය නොහැකි ද?

මහාතණ්හාසංඛය සූත්‍රයේ මවුකුසක ගැබක් පිහිටීම සඳහා හේතුවන කරුණු මෙසේ දක්වා ඇත.

01. මව ඔසප් තත්ත්වයට පත් වී සිටීම.
02. මවුපිය දෙදෙනා එකතුවීම.
03. ගන්ධබ්බයා එළඹ සිටීම.

25 MAY 2022
පුස්තකාලය

ගන්ධබ්බයාගේ එළඹීමෙහි වැදගත්කම එහි දී දැඩිව අවධාරණය කරමින්,"මව ඔසප් වූවත් මාපිය දෙදෙනා එකතු වූවත් ගන්ධබ්බයා එළඹ නොසිටියේ නම් ගැබක් නොපිහිටයි.[21] යනුවෙන් දක්වයි.

සාම්ප්‍රදායික පිළිගැනීමට අනුව අටුවාව මේ පිළිබඳව දක්වන අදහස ද විමසා බැලීම සුදුසුය. "ගන්ධබ්බයා යනු එහි එළඹි සත්ත්වයා" යැයි අටුවාව පිළිගනී. එහෙත්,

"පච්චුපට්ඨිතො හොති"[22] යනු මාපිය දෙදෙනාගේ එකතුව බලමින් ළඟ සිටියේ නම් නොවේ. කර්ම යන්ත්‍රයෙන් මෙහෙයවනු ලැබූ සත්ත්වයෙක් ඒ ඉඩෙහි උපදින්නේ වෙයි.[23] යනුවෙන් අට්ඨකථාව මුලින් දැක් වූ මතය හා එකඟවිය නොහැකි අදහසක් දෙවනුව ඉදිරිපත් කරයි. නමුත් මේ ප්‍රකාශනය ද සාම්ප්‍රදායික ථේරවාදී පිළිගැනීමට පටහැනිය. මරණයේ දී සිත නිරුද්ධවීමත් සමඟ ම ප්‍රතිසන්ධිග්‍රහණයට යොමුවේ යන්න මේ සාම්ප්‍රදායික පිළිගැනීමයි. අරහත් බවට පත්නොවූ පුද්ගලයකුගේ මරණයේ දී එක් භවයක අවසන් වූ චුති සිත භවංගය හෙවත් නිරුද්ධවීමත් සමඟ ම ඊළඟ භවය ආරම්භ වන ප්‍රතිසන්ධි සිත පහළ වෙයි. එක් භවයක් තුළ පහළවන චිත්ත සන්තතියේ එක් සිතක් හා ඊලඟ සිත අතර පරතරයක් හෙවත් ඉඩක් නැති පරිද්දෙන් ම පූර්ව භවයේ කෙළවර වූ චුති සිතත් ආයති භවයේ ආරම්භය වූ ප්‍රතිසන්ධි සිතත් අතර පරතරයක් නැත යන්න එම සාම්ප්‍රදායික පිළිග ැනීමයි. මෙම මතයෙහි එල්බගෙන සිටින සාම්ප්‍රදායික ථේරවාදය අන්තරාභවික ගන්ධබ්බ තත්ත්වය පිළිගැනීමට මැළිවෙයි.

අංගුත්තරනිකායේ සංයෝජන පුග්ගල සූත්‍රයේ දී පහත දක්වන අදහස් අන්තර්ගත පාඨ දක්නට ලැබේ.

I. "මහණෙනි, පුද්ගලයෝ සතර දෙනෙක් විද්‍යමාන වෙති. කවර සතර දෙනෙක් ද?" "මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයකුගේ ඕරම්භාගිය සංයෝජන ප්‍රහීන නැත. ඉපදීම ලබාදෙන සංයෝජන ප්‍රහීන නැත. භවය ලබාදෙන සංයෝජන ද ප්‍රහීන නැත. ඒ කවර පුද්ගලයා ද? සකෘදාගාමියාය"

II. "මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයකුගේ ඕරම්භාගිය සංයෝජන ප්‍රහීනය. ඉපදීම ලබාදෙන සංයෝජන ප්‍රහීන නැත. භවය ලබාදෙන සංයෝජන ද ප්‍රහීන නැත. ඒ කවර පුද්ගලයා ද? උද්ධංසෝත අකනිට්ඨගාමියාය"



III. "මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයකුගේ ඕරම්භාගිය සංයෝජන ප්‍රහීනය. ඉපදීම ලබාදෙන සංයෝජන ප්‍රහීනය. භවය ලබාදෙන සංයෝජන ප්‍රහීන නැත. ඒ කවර පුද්ගලයා ද? අන්තරා පරිනිබ්බායී පුද්ගලයාය"

IV. "මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයකුගේ ඕරම්භාගිය සංයෝජන ප්‍රහීනය. ඉපදීම ලබාදෙන සංයෝජන ප්‍රහීනය. භවය ලබාදෙන සංයෝජන ද ප්‍රහීන නැත. ඒ කවර පුද්ගලයා ද? රහතන් වහන්සේය"[24]

ඉහත විස්තරයෙහි තෙවැනි තැනට දක්වා ඇති අන්තරාපරිනිබ්බායී ශ්‍රාවකයා පිළිබඳව මෙහි දී විශේෂයෙන් අවධානය යොමු කළ යුතුය. ඔහුගේ ඕරම්භාගිය සංයෝජන ප්‍රහීනය. උත්පත්තිය ලබාදෙන සංයෝජන ප්‍රහීනය. නමුත් භවය ලබාදෙන සංයෝජන ප්‍රහීන නැත. උත්පත්තිය ලබාදෙන සංයෝජන ප්‍රහීන නිසා ඔහුට පඤ්ච සුද්ධාවාසාදී කිසිදු බ්‍රහ්ම ලෝකයකාදියක ඉපදීමට ශක්තියක් නැත. එහෙත් භවය ලබාදෙන සංයෝජන ප්‍රහීන නැති නිසා ඔහු අන්තරාභවයට පිවිස පිරිනිවන් පාන බව පැහැදිලි ය.

මනෝරථපූරණීය මෙම සංයෝජන සූත්‍රයේ විග්‍රහවන සකෘදාගාමි ශ්‍රාවකයා ගැන පමණක් අර්ථ විවරණ දක්වා අනාගාමි ශ්‍රාවකයා පිළිබඳ කිසිවක් නොපවසා නිශ්ශබ්ද වෙයි. මෙසේ "අන්තරා පරිනිබ්බායී" ශ්‍රාවකයා පිළිබඳ ව නිහඬවන අංගුත්තරනිකායේ සත්තක නිපාතයේ අනිච්චානුපස්සී සූත්‍රයේ දී අන්තරා පරිනිබ්බායී ශ්‍රාවකයා පඤ්චවිධ වූ ඕරම්භාගිය සංයෝජනයන් සිඳ අතරත පිරිනිවන් පාන බව පවසයි.[25] ඊට විස්තර සපයන අටුවාව,

"අන්තරාපරිනිබ්බායී නම් වූ යමෙක් පඤ්ච සුද්ධාවාසයන්ගෙ න් යම්කිසි තැනක ඉපදී උපන් ක්ෂණයෙහි ම හෝ ටිකක් ඉක්මවා හෝ ආයු මැද හෝ සිට රහත් බවට පැමිණෙයි"[26] යනුවෙන් කරුණු දක්වයි.

අන්තරාපරිනිබ්බායී ශ්‍රාවකයාගේ ස්වභාවය පෙළෙහි විස්තරවන ආකාරයට අනුව මෙහි දී සූත්‍ර හා අටුවා අතර පැහැදිලි විසංවාදයක් දක්නට ලැබේ. එනම් සූත්‍රවල අන්තරාපරිනිබ්බායී ශ්‍රාවකයාගේ විස්තර

විග්‍රහ වන ආකාරයට ඔහු තුළ උත්පත්තිය ලබාදෙන සංයෝජන ප්‍රහීනය.[27] ඔහු තුළ ශේෂව ඇත්තේ භවය ලබා දෙන සංයෝජන පමණි.[28] එහෙත් අටුවාව උත්පත්ති පටිලාභී සංයෝජන ප්‍රහීන වූ ඔහුට පඤ්ච සුද්ධාවාසයන්ගෙන් එකක උත්පත්තිය ලබාදෙයි. උත්පත්ති පටිලාභී සංයෝජන ප්‍රහීන වූ ඔහුට පඤ්ච සුද්ධාවාසයන්ගෙන් එකක උත්පත්තිය ලබාදෙන්නේ කෙසේ ද? මෙහි දී උත්පත්ති පටිලාභී සංයෝජන ප්‍රහීන වූ අන්තරා පරිනිබ්බායී ශ්‍රාවකයා පඤ්ච සුද්ධාවාසයන්ගෙන් එකක උත්පත්තිය ලබනු ඇතැයි අටුවාව පැවසුවේ එසේ නොපැවසුවහොත් සාම්ප්‍රදායික මතයට විරුද්ධ ව අන්තරාභවය තුළ දී ඔහු පිරිනිවන්පාන බව පිළිගැනීමට සිදු වන බැවිනි.

මෙත්ත සූත්‍රයේ මෛත්‍රී භාවනාව විස්තර කරන තැන පෙළ හා අටුවාව අතර ගැටීමක් දක්නට ලැබේ. ඛුද්දක පාඨයේ ''භූත'' යනු රහතන් වහන්සේලා[29] හැටියට ද ''සම්භවෙසී'' යනු සෙඛ හා පුථුජ්ජන[30] සත්ත්වයන් හැටියට ද දක්වා ඇත. මීට අර්ථ විවරණ සපයන අටුවාව 'භූත' යනු ''ජාතා අභිනිබ්බත්තා''[31] යැයි උපන් සත්ත්වයින් බව පවසයි. 'සම්භවෙසී' යනු ''සම්භවං එසන්ති''[32] යනුවෙන් සම්භවයක් හෙවත් ඉපදීම සොයන්නෝ යයි පවසයි. මෙහි දී ඉපදීම සොයමින් සිටින්නෝ යනු 'ගන්ධබ්බ' හෙවත් අන්තරාභවිකයන් බව ඉතා පැහැදිලි ය. මජ්ඣිම නිකායේ මහාතණ්හාසංඛය සූත්‍රයේ දී 'ගන්ධබ්බ'[33] යන්නට අටුවා විග්‍රහ සඳහන් වූ තැන ද ''ගන්ධබ්බොති තත්‍රූපකත්තො''[34] යනුවෙන් අටුවාවෙහි සඳහන් ව තිබෙන බව මෙම ලිපියෙහි ප්‍රථමයෙන් ද දක්වා ඇත. එහෙත් මෙම මතය ප්‍රතික්ෂේප කිරීමට සඳහා අටුවාව නැවත වරක් 'භූත' යනු රහතන් වහන්සේලා බවත්[35] 'සම්භවෙසී' යනු සේඛ පුථුජ්ජනයන් බවත්[36] අර්ථ විග්‍රහ කරයි. බුද්ධා දී ආර්ය උතුමන්ට හා කතකරණීය තත්ත්වයට පත්වූ රහතන් වහන්සේලාට මෛත්‍රීය වැඩීමේ සම්ප්‍රදායයක් ථෙරවාදී බුදුසමයේ නැත. මෙහි දී මෙම කාරණය පවා අටුවාවෙන් අමතක කරදමා ඇති බව පෙනෙයි.

සත්ත්වයා මරණින් මතු නැවත භවයට පමුණුවන සංස්කාර ධර්ම පවතී. පුනර්භවය ඇතිකිරීමට හේතුවන මේවා 'භව සංස්කාර'[37] යනුවෙන් හඳුන්වා ඇත. අටුවාව ද මේවා පුනර්භවය ඇති කරන භවයෙහි සංස්කරණය ලබාදෙන කර්ම වශයෙන් පිළිගනී.[38] ආයුසංස්කාර හා භවසංස්කාර යන වචන දෙක පාලි සූත්‍රවල



සමානර්ථවත්ව යෙදී ඇත. බුදුරදුන් චාපාල චෛතියේ දී ආයුසංස්කාර අත්හල බව මහාපරිනිබ්බාණ සූත්‍රයේ සඳහන් වෙයි. ''මුනීද්‍රතෙමේ භවසංස්කාර අත්හළ සේක''[39] යැයි එම සිද්ධිය සූත්‍රයෙහි දක්වා ඇත. උන්වහන්සේ ''යුධ සැට්ටයක් ගලවා දමන්නා සේ''[40] මෙම භව සංස්කාර අත්හල බව එහි වැඩි දුරටත් සඳහන් වෙයි. මේ ගාථාවේ භවසංඛාර යන වචනය සඳහන් කර ඇත්තේ ආයුසංස්කාර දක්වනු පිණිසය. මේ අනුව මෙතෙක් සිරුර තුළ පැවති භවසංස්කාර බුදුරදහු චාපාල චෛතියේ දී අත්හැර දැමූ සේක. අටුවාව ද මේ භවසංඛාර පුනර්භවය ගෙනදීමට සමත් කර්ම ලෙස පිළිගනී.[41] පොනොභවික භවසංඛාර[42] යනුවෙන් මේ පිළිබඳ අංගුත්තරනිකායේ දසක නිපාතයේ සඳහන් වන බව මීට ප්‍රථමයෙන් ද මේ ලිපියේ දක්වා ඇත. මෙසේ භවසංස්කාර අත්හැරීමෙන් පසු තථාගතයන් වහන්සේ තුන් මසක් ජීවිත සංස්කාර අධිෂ්ඨානකර වැඩ සිටියහ. භවසංස්කාර සහිත මරණයට පත්වන්නෝ භවයට පිවිසෙති. එසේ පිවිසෙන්නේ අන්තරාභවයටය යන ඉඟිය මහා අස්සපුර සූත්‍රයේ දක්නට ලැබේ.

අභිඥාලාභී භික්ෂුවක් සත්ත්වයන්ගේ චුති උත්පත්ති දකින ආකාරය එහි මෙසේ දක්වා ඇත. ''මහණෙනි, යම් සේ දොරටු සහිත ගෙවල් දෙකක් වෙයි. ඇස් ඇති පුරුෂයෙක් ඒ මැද සිට යම් සේ ගෙට පිවිසෙන මිනිසුන් ද නික්මෙන මිනිසුන් ද සක්මන්කරන්නවුන් ද හැසිරෙන්නවුන් ද දකින්නේ ද එපරිද්දෙන් ම ඒ භික්ෂුව මිනිස් ඇස ඉක්ම වූ පිරිසිදු දිව ඇසින් චුත වන්නා වූ ද උපදින්නා වූ ද හීන වූ ද ප්‍රණීත වූ ද සුවර්ණ වූ ද දුර්වර්ණ වූ ද සුගත වූ ද දුග්ගත වූ ද සත්ත්වයන් දකී''[43]

ඉහත සඳහන් කළ සූත්‍ර පාඨයට අනුව ගෙට යන්නා වූ ද එන්නා වූ ද මිනිසුන් හැටියට දිවැසින් බැලිය යුත්තේ චුත වූ සත්ත්වයන්ගේ කවර ධර්මයක් ද? සාම්ප්‍රදායික පිළිගැනීමට නුව නම් චුති පටිසන්ධි චිත්තක්ෂණ දෙක දෙමොහොතක දී සිදු වෙයි. මරණයේ දී නිරුද්ධ වූ සිත නැවත මවු ගැබක පහළ වෙයි. එසේ නම් මේ අතර බලන්නේ කුමක් ද?

මෙතෙක් අප විස්තර කරන ලද්දේ ථේරීය නිකාය ග්‍රන්ථවල චුති පටිසන්ධි අතර තත්ත්වය පිළිබඳව දක්වා ඇති කරුණු ය. එම කරුණු විස්තර කරන අට්ඨකතාව මූලික නිකාය ග්‍රන්ථයන්හි විස්තර වන

කරුණු ඒ ආකාරයෙන් ම පිළිගැනීමට අකැමැති වන නිසා උද්ගත වී ඇති තත්වයකි මේ. එම නිසා චුති පටිසන්ධි පිළිබඳ ව විවිධාකාරයේ මතවාද සමාජගත වී ඇත. කරුණු මෙසේ හෙයින් ථේරීය නිකාය ග්‍රන්ථවල හා අටුවාවන්හි දක්වන ආකාරයට චුති පටිසන්ධි පිළිබඳ ව තවදුරටත් ගවේෂණය කිරීම අත්‍යවශ්‍ය කාරණයක් බව මෙයින් පැහැදිළි වෙයි.

ථෙරවාදී සම්ප්‍රදායට අනුව අන්තරාභව සංකල්පය පිළිබඳ මෙහි දී කරුණු සාකච්ඡා කොට තිබේ. ඉන් පැහැදිලි වන්නේ අන්තරාභවය පිළබඳ අදහසය ථෙරවාදී විවරණයට අනුව පිළිගැනීමට කරුණු ප්‍රමාණවත්ව තිබෙන බවයි.

## ආන්තික සටහන්

1. බාලෙ ච පණ්ඩිතෙ ච කායස්සභෙදා උප්පජ්ජන්ති විනස්සන්ති න හොන්ති පරම්මරණා'ති. දීඝ නිකාය I, සාමඤ්ඤඵල සූත්ත, බු. ජ මු, පිට
2. යථාපි මූලෙ අනුපද්දවෙ දළ්හෙ ඡින්නෝපි රුක්ඛො පුනරෙව රූහති

   එවම්පි තණ්හානුසයේ අනූහතෙ නිබ්බත්තති දුක්ඛමිදං පුනප්පුනං. ඛුද්දක නිකාය I, ධම්මපද පාළි, තණ්හා වග්ගය, බු. ජ. මු. පිට 108
3. යථා තදේවිදං විඤ්ඤාණං සන්ධාවති සංසරති අනඤ්ඤං. මජ්ඣිම නිකාය I, මහාතණ්හාසංඛය සුත්ත, බු. ජ. මු, පිට 602.
4. - එම -, පි 606
5. අනෙකපරියායෙන පටිච්චසමුප්පන්නං විඤ්ඤාණං වුත්තං මයා. එම, පිට 606
6. අඤ්ඤත්‍ර පච්චයා නත්ථි විඤ්ඤාණස්ස සම්භවො. එම.
7. කම්මා විපාකා වත්තන්ති විපාකො කම්ම සම්භවො

   තස්මා පුනබ්බවො හෝති එවං ලොකෙ පවත්තති. විසුද්ධිමග්ග, පොල්වත්තෙ බුද්ධදත්ථෙන භික්ඛුනා සංසොධිතො, අලුත්ගම ගාමෙ සද්ධම්මපකාස යන්තාලයෙ මුද්දාපිතො, 2457, පිටකංකො 472.
8. අහමඤ්ඤත්‍ර රූපා අඤ්ඤත්‍ර වෙදනාය අඤ්ඤත්‍ර සඤ්ඤාය අඤ්ඤත්‍ර සංඛාරෙහි විඤ්ඤාණස්ස ආගතිං වා ගතිං වා චුතිං වා උප්පත්තිං වා වුද්ධිං වා විරූළ්හිං වා වෙපුල්ලං වා පඤ්ඤාපෙස්සාමීති නෙතං ඨානං විජ්ජති. සංයුක්ත නිකාය III, ඛන්ධ සංයුත්තය, උපාය වග්ගය, බීජ සුත්ත, බු. ජ. මු, පිට 96.



9. I. විඤ්ඤාණං ච හි ආනන්ද ච මාතුකුච්ඡිස්මිං න ඔක්කමිස්සථ, අපි නු ඛො නාමරූපං මාතුකුච්ඡිස්මිං සමුච්ඡිස්සථාති? නො හෙතං භන්තෙ.

   II. විඤ්ඤාණං ච හි ආනන්ද ච මාතුකුච්ඡිස්මිං ඔක්කමිත්වා වොක්කමිස්සථ, අපි නු ඛො නාමරූපං ඉත්ථත්තාය අභිනිබ්බත්තිස්සථාති, නො හෙතං භන්තෙ.

   III. විඤ්ඤාණං ච හි ආනන්ද දහරස්සෙව සතො වොච්ඡිජ්ජිස්සථ කුමාරකස්ස වා කුමාරිකාය වා අපි නු ඛො නාමරූපං වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සථාති, නො හෙතං භන්තෙ.

   IV. විඤ්ඤාණං ච හි ආනන්ද නාමරූපෙ පතිට්ඨං න ලභිස්සථ, අපි නු ඛො ආයතිං ජාතිජරාමරණං දුක්ඛසමුදය සම්භවො පඤ්ඤායෙථාති.

   V. තස්මාතිහානන්ද එසෙව හෙතු එතං නිදානං එස සමුදයො එස පච්චයො විඤ්ඤාණස්ස යදිදං නාමරූපං. දීඝ නිකාය I, මහානිදාන සුත්ත, බු. ජ මු, පිට 92.
10. I. යස්මිං පන භො ගොතම සමයෙ අච්චි වාතෙන ඛිත්තො දූරම්පි ගච්ඡති, ඉමස්ස පන භවං ගොතමො කිං උපාදානස්මිං පඤ්ඤාපෙහෙතීති? තම්හං වාතුපාදනං වදාමි. වාතොහිස්ස වච්ඡ තස්මිං සමයෙ උපාදානං හොතීති.

    II. යස්මිං පන භො ගොතම සමයෙ ඉමං ච කායං නික්ඛිපති, සත්තො ච අඤ්ඤතරං කායං අනුප්පන්නො හොති. ඉමස්ස ච පන භවං ගොතමො කිං උපාදානස්මිං පඤ්ඤාපෙති.? තම්හං තණ්හූපාදානං වදාමි. තණ්හාතිස්ස වච්ඡ තස්මිං සමයෙ උපාදානං හොතීති. සංයුත්ත නිකාය IV, අබ්‍යාකත සංයුත්තය, සළායතන වග්ගය, කුතුහලසාලා සුත්ත, බු. ජ. මු. පිට 702.
11. ඉමං ච කායං නික්ඛිපතීති චුති චිත්තෙන නික්ඛිපති අනුප්පන්නොහොතීති චුතික්ඛණෙයෙව පටිසන්ධි චිත්තස්ස අනුප්පන්නත්තා හොති. සාරත්ථප්පකාසිනී III, හෙ. වි. මු. පිට 107. පඤ්චප්පකරණට්ඨකථා I, හේ. වි. මු. පිට 151.
12. ශ්‍රී ධර්මවංශ හිමි මාතර, සිංහල විසුද්ධිමාර්ගය, ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම, වීදාගම බණ්ඩාරගම, 2000, පිටු 436, 437.
13. කථාවත්ථුප්පකරණට්ඨකථා II, අන්තරාභවකථා, හේ. වි. මු. පිටු 340-354.
14. සිරිඤාණිස්සර හිමි නිතලව, අභිධම්මත්ථවිභාවිනී ටීකා සන්නය, (සංස්කරණය) විමල හිමි මකුළුලෑවේ, සිලෝගම ටිකිරි බණ්ඩාර, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10. 2007, පිට 238.
15. Hostings Encyclopedia of Religion and Ethics, indian Historical Quarterly, Vol. [1],,, 1931, Page 119.

16. අත්ථසාලිනී නාම ධම්මසඞ්ගණිප්පකරණට්ඨකථා, (සංස්කරණ) පඤ්ඤානන්ද හිමි යගිරල, ත්‍රිපිටක මුද්‍රණාලය, 1940, පිට 77.

17. සංයුත්ත නිකාය III, ඛන්ධ සංයුත්තය, උපාය වග්ගය, බීජ සුත්ත, බු. ජ. මු. පිට 96.

18. I. තයො මෙ පොට්ඨපාද අත්තපටිලාභා, රූපී චාතුම්මහාභූතිකො කබලිංකාහාරභක්ඛො අයං ඔලාරිකො අත්තපටිලාභො. රූපී මනොමයො සබ්බඞ්ගපච්චඞ්ගී අහිනින්ද්‍රියො අයං මනොමයො අත්තපටිලාභො

II. රූපී මනොමයො සබ්බඞ්ගපච්චඞ්ගී අහිනින්ද්‍රියො අයං මනොමයො අත්තපටිලාභො.

III. අරූපී සඤ්ඤාමයො අයං අරූපො අත්තපටිලාභො. දීඝ නිකාය I, පොට්ඨපාද සුත්ත, බු. ජ. මු. පිට 424.

19. I. පුන ච පරං උදායි අක්ඛාතා මයා සාවකානං පටිපදා. යථාපටිපන්නා මෙ සාවකා ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනන්ති, රූපිං මනොමයං සබ්බංගපච්චංගිං අහිනින්ද්‍රියං.

II. සෙය්‍යථාපි උදායි මුඤ්ජම්හා ඊසිකං පබ්බාහෙය්‍ය, තස්ස එවමස්ස අයං මුඤ්ජො අයං ඊසිකා අඤ්ඤො මුඤ්ජො, අඤ්ඤා ඊසිකාත්වෙව ඊසිකා පබ්බාළ්හාති.

III. සෙය්‍යථාපි වා පනුදායි පුරිසො අහිං කරණ්ඩා උද්ධරෙය්‍ය, තස්ස එවමස්ස අයං අහි, අයං කරණ්ඩො, අඤ්ඤො අහි, අඤ්ඤො කරණ්ඩො, කරණ්ඩත්වෙව අහි උබ්භතොති.

IV. සෙය්‍යථාපි වා පනුදායී පුරිසො අසිං කොසියා පබ්බාහෙය්‍ය, තස්ස එවමස්ස අයං අසි, අයං කොසි අඤ්ඤො අසි, අඤ්ඤා කොසි, කොසියත්වෙව අසි පසබාළ්හොති.

V. එවමෙව ඛො උදායි අක්ඛාතා මයා සාවකානං පටිපදා යථා පටිපන්නා මෙ සාවකා ඉමම්හා කායා අඤ්ඤං කායා අඤ්ඤං කායං අඤ්ඤං අභිනිම්ත්තනන්ති රූපිං මනොමයං සබ්බංගපච්චංගිං අහිනින්ද්‍රියං. මජ්ඣිම නිකාය II, මහාසකුලුදායි සුත්ත, බු. ජ. මු. පිට 358.

20. එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං මනොමයං කායං අභිනිම්මිත්තානං යදිදං චූල්ලපන්ථකො. අංගුත්තර නිකාය I, එතග්ගදපාලි, බු. ජ. මු. පිට 46.

21. I. මාතා ච උතුනී හොති, මාතාපිතරො සන්නිපතිතා හොන්ති, ගන්ධබ්බො ච පච්චුපට්ඨිතො හොති, එවං තිණ්ණං සන්නිපාතා ගබ්භස්සාවක්කන්ති.



II. ඉධ මාතා ච උතුනී හොති, මාතාපිතරො ච සන්නිපතිතා හොන්ති, ගන්ධබ්බො ච න පච්චුපට්ඨිතො හොති, නෙව තාව ගබ්භස්සාවක්කන්ති හොති. මජ්ඣිම නිකාය I, මහාතණ්හාසංඛය සුත්ත, බු. ජ. මු. පිට 622.

22. ගන්ධබ්බොති තත්‍රූපකසත්තො. පපඤ්චසූදනී II, හේ. වි. මු. 1943, පිට 258.

23. පච්චුපට්ඨිතො හොතීති න මාතා පිතුන්නං සන්නිපාතං ඔලොකයමානො සමීපෙ ඨිතො නාම හොති, කම්මයන්ත-යන්තිතො පන එකො සත්තො තස්මිං ඔකාසෙ නිබ්බත්තනකො හොතීති. එම, පිට 258.

24. I. චත්තාරො භික්ඛවෙ පුද්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං, කතමෙ චත්තාරො. ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ලස්ස ඔරම්භාගියානි සංයොජනානි අප්පහීණානි හොන්ති, උප්පත්තිපටිලාභියානි සංයොජනානි අප්පහීනා හොන්ති, භවපටිලාභියානි සංයොජනානි අප්පහීනා හොන්ති, කතමස්සා පුග්ලස්සා? සකදාගාමිස්ස.

II. ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ලස්ස ඔරම්භාගියානි සංයොජනානි පහීණානි හොන්ති, උප්පත්තිපටිලාභියානි සංයොජනානි අප්පහීනා හොන්ති, භවපටිලාභියානි සංයොජනානි අප්පහීනා හොන්ති, කතමස්ස පුග්ලස්ස? උද්ධංසොතස්ස අකනිට්ඨගාමිනො.

III. ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ලස්ස ඔරම්භාගියානි සංයොජනානි පහීණානි හොන්ති, උප්පත්තිපටිලාභියානි සංයොජනානි පහීනා හොන්ති, භවපටිලාභියානි සංයොජනානි අප්පහීනා හොන්ති, කතමස්ස පුග්ලස්ස? අන්තරාපරිනිබ්බායිස්ස.

IV. ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ලස්ස ඔරම්භාගියානි සංයොජනානි පහීණානි හොන්ති, උප්පත්තිපටිලාභියානි සංයොජනානි පහීනා හොන්ති, භවපටිලාභියානි සංයොජනානි අප්පහීනා හොන්ති, කතමස්ස පුග්ලස්ස? අරහතො. අංගුත්තර නිකාය II, චතුක්ක නිපාතය, සංයොජන පුග්ගල සුත්ත, බු. ජ. මු. පිට 258.

25. සො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයං අන්තරාපරිනිබ්බායි හොති. අංගුත්තර නිකාය II, සත්තක නිපාතය, ධන වග්ගය, අනිච්චානුස්සී සුත්ත, බු. ජ. මු. පිට 298.

26. අන්තරාපරිනිබ්බායිතී, සො පඤ්චසු සුද්ධාවාසෙසු යත්ථ කත්ථචි උප්පන්නො නිබ්බත්තක්ඛණෙ වා ඨොකං අභික්කමිත්වා වා වෙමජ්ඣෙ ඨත්වා අරහත්තං පාපුණාති. මනොරථපූරනී II, හේ. වි. මු. පිට 700.

27. උප්පත්තිපටිලාභියානි සංයොජනානි අප්පහීනානි. අරහතො. අංගුත්තර නිකාය II, චතුක්ක නිපාතය, සංයොජන පුග්ගල සුත්ත, බු. ජ. මු. පිට 258.

28. භවපටිලාභියානි සංයොජනානි අප්පහීනානි. එම,

29. ඛුද්දක නිකාය I, ඛුද්දක පාඨ, මෙත්ත සුත්ත, බු. ජ. මු. පිට 21.

30. එම,

31. පරමත්ථජොතිකා, හේ. වි. මු. පිට, 164.

32. එම,

33. මජ්ඣිම නිකාය I, මහාතණ්හාසංඛය සුත්ත, බු. ජ. මු. පිට 622.

34. පපඤ්චසූදනී II, හේ. වි. මු. 1943, පිට 258.

35. යෙ ච භූතා න පුන භවිස්සන්තීති සංඛං ගච්ඡන්ති තෙසං ඛීණාසවානං එතං අධිවචනං. පරමත්ථජොතිකා, හේ. වි. මු. 164.

36 සම්භවෙසී, අප්පහීනභවසංයොජනත්තා ආයතිම්පි සම්භවං සන්තානං සෙඛපුථුජ්ජනානමෙතං අධිවචනං. එම,

37. පොනොභවිකො භවංඛාරො. අංගුත්තර නිකාය IV, දසක නිපාතය, අක්කොස වග්ග, සරීරට්ඨ ධම්ම සුත්ත, බු. ජ. මු. 158.

38. පොනොභවිකො භවසංඛාරොති පුනබ්භවනිබ්බත්තකො භවසංඛරණක කම්මං. මනොරථපූරනී II, හේ. වි. මු. පිට 841.

39. භවසංඛාර මවස්සජී මුනි. දීඝ නිකාය II, මහාපරිනිබ්බාණ සුත්ත, 166.

40. අභින්දි කවචම්වත්ත සම්භවන්ති. එම,

41. භවසංඛාර අවස්සජීති, පුනම්භව සංකරණකං විස්සජ්ජෙසි. සුමංගලවිලාසිනී I, හේ. වි. මු. පිට 387.

42. අංගුත්තර නිකාය IV, දසක නිපාතය, අක්කොස වග්ග, සරීරට්ඨ ධම්ම සුත්ත, බු. ජ. මු. 158.

43. සෙය්‍යථාපි භික්ඛවෙ ද්වෙ අගාරා සද්වාරා තත්ථ චක්ඛුමා පුරිසො මජ්ඣෙ ඨිතො පස්සෙය්‍ය මනුස්සෙ ගෙහං පවිසන්තෙපි නික්ඛමන්තෙපි අනුචංකමන්තෙපි අනුවිචරන්තෙපි සත්තෙ ඛො භික්ඛවෙ භික්ඛු දිබ්බෙන චක්ඛුං විසුද්ධෙන අතික්කන්තෙන මානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උප්පජ්ජමානෙ හීනෙ පණිතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථා කම්මූපගතෙ සත්තෙ පජානාති. මජ්ඣිම නිකාය I, මහා යමක වග්ගය, මහා අස්සපුර සුත්ත, පිට 648.